**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය - 2022**

**------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ "මණ්ඩලය" සහ එහි පරිපාලිතයෙහි "සමූහය" 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (1)154 ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකරව මාගේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර තර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමේ දී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන ලදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රදා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හදුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලයන් මගහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනිමේ අදාලත්වය තිරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරික්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලය විසින් 1981 සිට 2021 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුල සේවායෝජකයින් 3,912 කට අදාලව 2021 අප්‍රේල් 28 දිනට අයකරගෙන තිබූ එකතුව රු.මිලියන 581.35 ක දායක මුදල් 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනතේ 16 (3) වගන්තිය ප්‍රකාරව ඒ ඒ සාමාජිකයින්ගේ පෞද්ගලික ගිණුම්වලට බැර නොකර වෙනත් තාවකාලික ගිණුම්වල රඳවා තබාගෙන පැවතුණි. මේ තුල වසර 7 ත් 41 ත් අතර කාලයක සිට පැවතෙන එන ශේෂය රු.මිලියන 90.76 ක් විය. | විභජනය කලයුතුව ඇති දායක මුදල් විභජනය සඳහා දුරකථන ඇමතුම් ලබාදීම, ලියාපදිංචි තැපෑලෙන් ලිපි යොමු කිරීම, මණ්ඩලයේ ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන් අදාල ආයතන වෙත යවා තොරතුරු ලබා ගැනීමේ කටයුතු කරනු ලැබේ. එමෙන්ම ඉදිරියේදී සේවක අර්ථසාධක අරමුදලෙන් සී වාර්තා ලබාගෙන,එම වාර්තා පදනම් කරගෙන ආකෘති II වාර්තා සකස් කර, ඒ අනුව සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමට යෝජනා කිරිම. | දායක මුදල් බැරවිය යුතු සාමාජිකයන් නිවැරදිව හා කඩිනමින් හඳුනාගත හැකි ආකාරයට සාමාජික මුදල් අයකිරිමේ ක්‍රමවේදය වැඩිදියුණු කිරීම හා හඳුනා නොගත් සාමාජික මුදල් හඳුනාගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කල යුතුය. |
| (ආ) | 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනතේ 16 (3) වගන්තිය ප්‍රකාරව යම් සේවා නියුක්තයෙකු සම්බන්ධයෙන් ( 1 ) වන උප වගන්තිය ප්‍රකාරව මණ්ඩලය විසින් | සාමාජික ගිණුම්වලට බැර නොකල ශේෂය අවම කිරීම සඳහා 2023 පෙබරවාරි සිට සේවකයින් 15 කට වැඩි පිරිසක් සේවය කරන ආයතනවල ගෙවීම් විද්‍යුත් ගෙවීම් යටතේ කිරීමටද, මණ්ඩලයේ | අධිකරණ ක්‍රියාමාර්ග වලින් අයකරගත්මුදල් ප්‍රමාදයකින් තොරව සාමාජික ගිණුම්වලට බැර කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අධිකරණ කටයුතු මගින් 1985 සිට 2022 වර්ෂය දක්වා අයකරගෙන තිබූ රු.මිලියන 1,511.14 ක වටිනාකම වු දායක මුදල් හා අධිභාර මුදල්වලින් රු.මිලියන 71.25 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් සේවා නියුක්තයාගේ පෞද්ගලික ගිණුම්වලට බැර කර නොතිබුණි. | ක්‍රියාත්මක කිරිමේ නිලධාරීන් හරහා තොරතුරු ලබා ගැනීමටද, සේවක අර්ථසාධක අරමුදල හරහා තොරතුරු ගෙන්වා ගැනීමටද කටයුතු කරනු ලැබේ. | |
| (ඇ) | 2021 දෙසැම්බර් 31 දිනට පරිගණක පද්ධතියට අනුව සාමාජිකයින්ගේ පෞද්ගලික ගිණුම්වලට බැර නොකල ශේෂය රු.මිලියන 781.05 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වල සටහන අංක 34 යටතේ එම ශේෂය රු.මිලියන 290 ක් ලෙස හෙළිදරව් කර තිබුණි. | 2020 සහ 2021 වර්ෂවල සාමාජික මුදල් විභජනය 2022 සහ 2023 වර්ෂ වලදී සිදුකරනු ලබයි. එබැවින් සත්‍ය වශයෙන්ම ප්‍රායෝගික ගැටළු මත විභජනය නොවූ සාමාජික මුදල් වනුයේ 2019 වර්ෂයට පෙර ලද සාමාජික මුදල් වේ. ඒ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 34 යටතේ හෙළිදරව් කිරීමට කටයුතු කර ඇත්තේ දිර්ඝකාලීන සත්‍ය වශයෙන්ම ප්‍රායෝගික ගැටළු ඇති ශේෂවල වටිනාකම වේ. | සාමාජික ගිණුම තුල ඇතුලත් මෙම ශේෂයේ සංයුතිය වර්ග කර ගිණුම් සටහන් යටතේ අනාවරණය කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දැනට ඈවර කරමින් පවතින සමාගමක පොරොන්දු නෝට්ටුවල ආයෝජන කර තිබූ රු.මිලියන 12.17 ක් හා ණයකරවල ආයෝජනය කර තිබූ රු.මිලියන 4.45 ක් පිළිවෙලින් 2002 හා 2007 වර්ෂවලදී උපලබ්ධි විය යුතුව තිබුණි. තවද, වනික් සමාගමෙහි ණයකරවල ආයෝජනයෙන් 2006 දෙසැම්බර් 31 දක්වා අයවිය යුතු පොළි ආදායම් රු.මිලියන 15.21 ක් හා පොරොන්දු නෝට්ටුවල ආයෝජනයෙන් අයවිය යුතු පොළී ආදායම් රු.367,724 ක් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් පැවතියද 2021 දෙසැම්බර් 31 දින වන විටත් අයකර | මෙම සමාගම ඈවරකිරීම සඳහා තෙවන පාර්ශවයක් විසින් කරන ලද ඉල්ලීමට ඈවරකරුවෙකු පත්කරන ලෙස අධිකරණයෙන් නියම කොට ඇත. ඈවරකිරීමේ ක්‍රියාවලිය මෙතෙක් නිම වී නොමැත. | පසු විපරම් කටයුතු සිදුකර අයවිය යුතු පොළී ආදායම අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගැනීමට මණ්ඩලයට නොහැකි වී තිබුණි. | | |
| (ආ) | වර්ෂ ගණනාවක සිට වැවිලි සමාගමකින් ලැබිය යුතුව පැවති ණයකර පොළී මුදල් වලින් තවදුරටත් ලැබිය යුතු රු.මිලියන 9.39 ක මුදල 2022 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | සමාගමේ වර්තමාන මූල්‍ය තත්ත්වය සැළකීමේදී මෙම පොළී මුදල් පියවීමට යම්කිසි කාලයක් ගතවිය හැකි බවත්, මේ පිළිබදව ඉදිරි සැළැස්මක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවත්, ඒ පිළිබදව පසු විපරම් කර එම යෝජනා ඉදිරිපත් වීමෙන් පසුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගනු ලැබේ. | පසු විපරම් කටයුතු සිදුකර අයවිය යුතු පොළී ආදායම අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.6.2 ගෙවිය යුතු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උසස් අධ්‍යාපන ශිෂ්‍යාධාර ක්‍රමය යටතේ ගෙවීම් කිරීම සඳහා 2022 දෙසැම්බර් 31 දිනට වෙන්කළ ශේෂය වූ රු.මිලියන 147.16ක් තුළ 2019 සහ 2020 වර්ෂවලට අදාලව වෙන්කළ පිළිවෙලින් රු.මිලියන 0.12 ක් හා රු.මිලියන 3.04ක් තවදුරටත් නිරවුල් කිරිමට පැවතුණි. | හිමිකම්ලාභීන්ගේ මූලික ලේඛණවල පවතින අඩුපාඩු සපුරා ගැනීමට ලියාපදිංචි තැපැල මගින්, දුරකතන මගින්, විද්‍යුත් තැපැල මගින් සහ වට්ස් ඇප් මගින් දැනුවත් කිරීම් සිදුකලද යහපත් ප්‍රතිචාරයක් නොලැබීම නිසා මේ වනවිටත් නිරවුල් කිරීමට නොහැකි වි ඇත. | අදාල හිමිකම්ලාභීන් හදුනාගැනීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කර නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | වර්ෂ 1994 සිට 2014 වර්ෂය දක්වා පහ වසර ශිෂ්‍යත්ව මූල්‍යාධාර ක්‍රමය යටතේ ශිෂ්‍යයන් 73 දෙනෙකු සඳහා නොගෙවූ රු.මිලියන 1.27 ක මුදල අදාල ශිෂ්‍යත්වලාභීන්ට නොගෙවා සමාලෝචිත වර්ෂය තුළ දී ආදායමට බැර කර තිබුණි. මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ 2022 දෙසැම්බර් 31 දිනට පහ වසර ශිෂ්‍යත්ව මූල්‍යාධාර ගෙවීම් කිරීම සඳහා වෙන්කළ ශේෂය වූ රු.මිලියන 235.3 තුළ 2020 හා 2021 වර්ෂවලට අදාලව පිළිවෙලින් වෙන්කළ රු.මිලියන 0.075 ක්, රු.මිලියන 13.6 ක මුදල් තවදුරටත් නිරවුල් කිරිමට පැවතුණි. | 1994 – 2014 කාලපරිච්ඡේදයට අදාල හිමිකම් නොපෑ ශිෂ්‍යත්වලාභීන් හදුනාගැනීමට ප්‍රමාණවත් තොරතුරු නොමැති බැවින් මෙම ශේෂය නිරවුල් කිරීමට නොහැකි වී ඇත. විගණන හා කළමණාකරන කමිටු රැස්වීමේ දී ලද එකගතාවය මත අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකා අංක 227/2022 මගින් 2022 ඔක්තෝබර් මස 24 දින අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේ දී මෙම මුදල් මණ්ඩලීය ගිණුමට බැර කිරිමට අනුමැතිය ලබා ගන්නා ලදි. | අදාල හිමිකම්ලාභීන් හදුනාගැනීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කර නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට හිමිකම් නොපාන ලද මරණ ප්‍රතිලාභ | සාමාජිකයන්ගේ මරණයෙන් පසු එකී සාමාජිකයාගේ ප්‍රතිලාභ සඳහා එක් | අදාල හිමිකම්ලාභීන් හදුනාගැනීමට විධිමත් |

| | | |
|---|---|---|
| ලෙස සාමාජිකයන් 1,207 කට අදාලව රු. මිලියන 21.43 ක් ගෙවිය යුතුව පැවතුණි. 1995 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ මියගිය පුද්ගලයන්ට අදාලව ගෙවිය යුතු මරණ ප්‍රතිලාභීන්ගේ කාල විශ්ලේෂණය තුළ වසර 07 ත් 20 ටත් වැඩි කාල පරාසයට අයත් ප්‍රතිලාභීන් 786 කට ගෙවිය යුතු මරණ ප්‍රතිලාභ මුදල රු.මිලියන 8.87 ක් විය. | අයෙකුට වඩා හිමිකම්ලාභීන් සිටින අවස්ථාවලදී, එකී හිමිකම්ලාභීන් සියළුදෙනාම එකවර ඉදිරිපත් නොවීම (එනම් සමහර හිමිකම්ලාභීන් විදේශගතව සිටීම) සහ ඇතැම් අයට ප්‍රමාණවත් ලිඛිත තොරතුරු (සහතිකපත් කඩිනමින් ඉදිරිපත් නොකිරීම) ඉදිරිපත් කිරීමට ඇති අපහසුතාවයන් නිසා ඔවුන්ගේ කොටස්, මණ්ඩලයේ ගිණුමේ රඳවාගෙන, ලේඛණ ඉදිරිපත් කර ඇති අයගේ හිමිකම් කොටස් පමණක් ගෙවීම් කිරීමට කටයුතු කිරීම වර්තමානයේ අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග වේ. | වැඩපිළිවෙලක් සකස් කර නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 හා 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008 (I) දරන රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛ | පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර ක්‍රියාත්මක කල යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | සමස්ත මණ්ඩලය සඳහා වූ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය ඉක්මනික් සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කර තිබේ. | චක්‍රලේඛ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 න් සංශෝධිත ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 10 වන වගන්තිය | සමාලෝචිත වර්ෂයේ දී ණය ලිපිගොනු 67 කට අදාලව සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවේ දී අදාළ නිළධාරීන්ට ලබා දිය හැකි උපරිම ණය ප්‍රමාණය රු.මිලියන 16.75 ක් වුවද, චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව රු.මිලියන 41.23 ක් එනම් රු.මිලියන 24.48 ක් වැඩිපුර ගෙවා තිබුණි. | 2022 වර්ෂයේ දී අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ලබාදුන් අනුමැතිය අනුව ණය මුදල රු.250,000 ක උපරිම සීමාවකට යටත් කර ඇත. | චක්‍රලේඛ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ සමූහයේ මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 37,680 ක් හා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 36,978 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ සමූහයේ හා මණ්ඩලයේ ලාභ පිළිවෙලින් රු.මිලියන 28,595ක් හා රු.මිලියන 28,569 ක් විය. ඒ අනුව සමූහයේ හා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය පිළිවෙලින් රු.මිලියන 9,085 කින් හා රු.මිලියන 8,409 කින් වර්ධනය වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී මණ්ඩලයේ පොළී ආදායම් රු.මිලියන 12,221 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලවල වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමණාකරන අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සාමාජිකයන් සඳහා ලබාදෙන ශ්‍රම සුව රක්ෂණ ක්‍රමය යටතේ සාමාජිකයෙකුට ජීවිත කාලය තුල වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය වෙනුවෙන් උපරිම රු.50,000 ක් පිරිනමන අතර, මෙම උපරිමය වර්ෂ 12 කට වැඩි කාලයක සිට ඉහළ නැංවීම කෙරෙහි කළමනාකරනයේ අවධානය යොමු කර නොතිබුණි. එහෙත්, මණ්ඩලයේ කාර්ය මණ්ඩලය උක්ත රක්ෂණ ක්‍රමයෙන් ද ආවරණය වී තිබියදි මණ්ඩලයේ නිසි අවරයකින් තොරව මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ලබාදෙන වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණ ක්‍රමය යටතේ රෝහල ගතවි ලබන ප්‍රතිකාර සහ රෝහල් ගත නොවී ලබන ප්‍රතිකාර සඳහා වර්ෂයකට ලබාදෙන වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණ දීමනාව පිළිවෙලින් රු. 75,000 සිට රු.100,000 දක්වා රු.40,000 සිට රු.60,000 දක්වාත් 2018 වර්ෂයේ දි ඉහල දැමීමට කටයුතු කර තිබුණි. ඒ අනුව ශ්‍රමසුව රක්ෂණ ක්‍රමය යටතේ වෛද්‍යාධාර වියදම රු.මිලියන 23.47 ක්ව පැවතියදී, කාර්ය මණ්ඩල වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණ මුදල රු.මිලියන 119.7 ක් වී තිබුණි. | වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණ මුදල 2018 වසරේ සිට ඉහළ දැමීමට මණ්ඩලයේ ක්‍රියාත්මකව පවත්නා වෘත්තීය සමිති යෝජනාව සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදී ඇත. සමාලෝචිත වර්ෂය තුලදී කාර්ය මණ්ඩල වෛද්‍ය වියදම් දීමනා කිසිවක් වැඩිකිරීමට කටයුතු කර නොමැත. එහෙත් ඇතිව තිබූ ආර්ථික අර්බුදය හමුවේ ඇති වූ අධි උද්ධමනකාරී තත්ත්වය හේතුකොටගෙන රෝහල් ගාස්තු හා ඖෂධ වියදම් ඉහළ යෑම හේතුකොටගෙන මෙකී ප්‍රතිපූර්ණ වියදම් ඉහළ ගොස් තිබුණි. | අරමුදලේ සාමාජිකයන් සඳහා ප්‍රශස්ථ ප්‍රතිලාභයන් ලබාදීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සංස්ථාපිත පනත අනුව මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා මණ්ඩලයේ සභාපතිවරයා වන්නේය. කෙසේ වුවද, මූල්‍ය කටයුතු සම්බන්ධ ආයතනයක් ලෙස මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා එහි සභාපතිවරයා විය යුතු බවට වන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 5 (2) වගන්තිය සංශෝධනය කල යුතු බවට 2016 අගෝස්තු 26 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේ දී නිර්දේශ කර තිබුණි. එසේ වුවද 2022 වර්ෂය අවසාන වන විටත් පනත සංශෝධන කටයුතු නිම කර නොතිබුණි. | සංශෝධන සම්බන්ධයෙන් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් මූලික කෙටුම්පත සකස් කර ඇත. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත සංශෝධනය කිරීමට සමගාමීව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ලබාදී ඇති උක්ත නිර්දේශයට අනුකූල සංශෝධනයද ක්‍රියාත්මක කිරීම පිළිබඳව 2023 අප්‍රේල් 24 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී සාකච්ඡා කෙරුණු අතර, මේ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අදහස් හා උපදෙස් ලිඛිතව ලබාගෙන ඊට අදාල ඉදිරි කටයුතු සිදුකිරීමට මණ්ඩලය තීරණය කරනු ලැබීය. | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවෙන් ලබාදුන් නියෝග ක්‍රියාත්මක කිරීමට කළමනාකරණය කටයුතු කල යුතුය. |
| (ඇ) | මණ්ඩලයේ රජයේ සුරැකුම්පත්වල අරමුදල් ආයෝජනය කරන ප්‍රධාන පෙළේ ආයතනයක් වුවද, සුරැකුම්පත් වෙන්දේසිවලදී ඍජුවම මිල ගණන් ඉදිරිපත් කිරීමේ පහසුකම (Direct bidding facility) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබාගෙන නොතිබුණි. 2016 අගෝස්තු 26 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාථමික ගනුදෙනුකරුවෙකු (Primary Dealer) ලෙස ලියාපදිංචි වන ලෙසට නියෝග කර තිබුණද, 2022 දෙසැම්බර් 31 දින වන විටත් එසේ සිදුකර නොතිබුණි. | මෙම පහසුකම ලබා ගැනීම සඳහා අනුමැතිය ලබාගැනීමට පවතින දුෂ්කරතා, දැරීමට සිදුවන ප්‍රාග්ධන වියදම් සීමා, නව බඳවා ගැනීම්වලට පවතින සීමා, පවතින වැටුප් පරිමාවන් යටතේ එම ක්ෂේත්‍රයේ සුදුසුකම්ලත් දක්ෂ නිලධාරීන් බඳවා ගැනීම, රඳවා ගැනීම සහ නැවත බඳවා ගැනීමට ඇති අපහසුව සහ මීට අදාල අනිකුත් යටිතල පහසුකම් සපයා ගැනීමේ පවතින ගැටළු වැනි කරුණු සළකා බැලීමේ දී මෙම කාර්යය සිදුකිරීම වර්තමානයේ දී මහජන බැංකුව මගින් කිසිදු වියදමකින් සහ අමතර සේවකයින් යෙදවීමකින් තොරව ලබාගනී. | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවෙන් ලබාදුන් නියෝග ක්‍රියාත්මක කිරීමට කළමනාකරණය කටයුතු කල යුතුය. |
| (ඈ) | 2022 ඔක්තෝබර් මස 19 වන දින මෝටර් රථයකට සිදුවූ අනතුරින් අලුත්වැඩියා කිරීම ආර්ථික වශයෙන් ඵලදායි නොවන බැවින් රක්ෂිත ආයතනය මණ්ඩලයට ගෙවීමට එකග වී ඇති මුදල රු.8,100,000 කි. මණ්ඩලය විසින් වර්තමාන වෙළඳ වටිනාකම වූ රු.11,000,000 ක් මත රක්ෂණය නොකර 2018 වර්ෂයේ වෙළඳ වටිනාකම වූ රු.8,125,000 ක් මත පූර්ණ රක්ෂණය සිදු කිරීමෙන් | මෙම රථයට සිදුවූ අනතුර හේතුවෙන් රු.8,100,000 ක රක්ෂණ හිමිකමක් මණ්ඩලයට ලබා දීමට රක්ෂණ සමාගම එකග වී තිබුණි. මණ්ඩලය සතු සියළු වාහන නැවත වර්තමාන වෙළඳපොල වටිනාකමට අනුකූලව තක්සේරු කිරීමට කටයුතු කර තිබෙන අතර නව තක්සේරු වටිනාකමට අදාලව රක්ෂණ ආවරණය ලබා ගැනීමටද කටයුතු කර ඇත. කෙසේ වෙතත් මෙම වාහනයේ | මණ්ඩලයට සිදු වූ පාඩුව වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට හා වර්තමාන වෙළඳපොල වටිනාකම අනුව රක්ෂණය කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මණ්ඩලයට රු.2,875,000 ක රක්ෂණ ප්‍රතිලාභ අහිමි වීමේ තත්ත්වයක් ඇති වී තිබුණි. | අනතුර සිදු වී ඇත්තේ 2022 ඔක්තෝබර් 09 වන දින වන අතර එතෙක් වාහන තක්සේරු වාර්තා ලැබී නොතිබුණු හෙයින් පිරිවැයට රක්ෂණය කර තිබුණි. මණ්ඩලය විසින් නව රක්ෂණ වර්ෂය සඳහා වර්තමාන වෙළඳපොළ වටිනාකමට තක්සේරු කිරීමට අදාල කාල පරිච්ඡේදය වී ඇත්තේ 2022 නොවැම්බර් 03 දින සිට වේ. | |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට ලැයිස්තුගත සමාගම් 13 ක සිදුකර තිබූ ආයෝජනයන්ගේ සාමාන්‍ය පිරිවැය රු.මිලියන 909.89 ක් වූ කොටස් සඳහා 2022 වර්ෂයේ ලාභාංශ ආදායමක් ලැබී නොතිබුණි. ඉන් සමාගම් 2 ක් 2015 සිට 2022 වර්ෂය දක්වා නොකඩවා ලාභාංශ ලැබී නොතිබුණු අතර, සමාගම් 11 ක් සඳහා 2015-2022 දක්වා කාලයට වරින් වර ලාභාංශ කොටසක් පමණක් ලැබී තිබුණි. | 2015 සිට 2021 දක්වා නොකඩවා ලාභාංශ නොලැබූ සමාගම් 02 ක් පමණක් ඇති අතර, අනෙකුත් සමාගම් 08 ක් සඳහා 2015 සිට 2021 වසර දක්වා වරින් වර වාර්ෂිකව ලාභාංශ ලෙස එකතුව රු.මිලියන 171 ක් මණ්ඩලයට ලැබී ඇත. සමාගම් 15 න් සමාගම් 4 ක් සඳහා 2023 අප්‍රේල් මස වන විට ලාභාංශ ලෙස රු.මිලියන 52.6 ක් ලැබී ඇත. එලෙසම අනෙකුත් සමාගම් සඳහා ද සමාගම්වල ලාභදායිත්වය මත ලාභාංශ ඉදිරියේ දී ලැබෙනු ඇතැයි අපේක්ෂා කරමු. | සාමාජිකයන්ට ඉහළ ප්‍රතිලාභයක් ලබා දීමට හැකි පරිදි ආයෝජන කළඹ කළමණාකරණය කළ යුතුය. |
| (ආ) | මණ්ඩලය විසින් සමාගමක සිදුකරන ලද කොටස් මිලදී ගැනීම් පරික්ෂාවේ දී 2021 සහ 2022 වර්ෂවලදී පිළිවෙලින් කොටස් 7,106,832 ක සහ කොටස් 615,542 ක ආයෝජනය කර තිබුණි. එම සමාගමෙහි පසුගිය වර්ෂයන්හි මූල්‍ය ප්‍රකාශන පරික්ෂාවේ දී 2017, 2019 සහ 2021 වර්ෂයන්හිදී අලාභ ලැබූ ආයතනයක්ව තිබියදී ඒ පිළිබඳව අවධානය යොමු නොකර 2021 සහ 2022 වර්ෂවල පිළිවෙලින් රු.මිලියන 64.01 ක් සහ රු.මිලියන 4.99 ක් වැය කර කොටස් මිලදී ගැනීම සිදුකර තිබුණි. තවද, 2022 දෙසැම්බර් විගණන | මණ්ඩලයේ කොටස් ආයෝජන කළඹ විවිධාංගීකරණය කිරීමේ පරමාර්ථයෙන් එම වසරේ රෝහල් ක්ෂේත්‍රයේ පැවති පිබිදීම සහ අධික ඉල්ලුම හේතුවෙන් ද, ඉදිරියේ දී ඇතිවිය හැකි වර්ධන අවස්ථා විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව 2021 වර්ෂයේ අගභාගයේදී රෝහල් ක්ෂේත්‍රයට අදාලව නවලෝක සමාගමේ නිකුත් කල කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 0.5 ක පමණ වන කොටස් ප්‍රමාණයක ආයෝජනය කරන ලදි. 2020/2021 ගිණුම් වර්ෂයේ දී නවලෝක | සාමාජිකයන්ට ඉහළ ප්‍රතිලාභයක් ලබා දීමට හැකි පරිදි ආයෝජන කළඹ කළමණාකරණය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දිනය වන විට මෙම සමාගම කොටස් වෙළඳපොළ නීතිරීති වලට අනුකූලව කටයුතු නොකිරීම හේතුවෙන් Watch List යටතේ දක්වා තිබුණි. | සමාගම අලාභ තත්ත්වයක් පෙන්නුවද, නවලෝක රෝහල් සමූහය වශයෙන් ගත්කල 2020/2021 මූල්‍ය ප්‍රකාශනවල ලාභදායී තත්ත්වයක් පෙන්වා ඇත. | |
| (ඈ) | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2022 වර්ෂයේ පැවැත්වූ වෙන්දේසි අවස්ථා 23 කදී ඉදිරිපත් කල කාණ්ඩ අංක අතුරින් භාණ්ඩාගාර බැදුම්කර කාණ්ඩ අංක 28 ක් සඳහා මණ්ඩලය මගින් ලංසු ඉදිරිපත් කර තිබුණි. ඉන් කාණ්ඩ අංක 12 ක් සඳහා ඉදිරිපත් කල ලංසු වලින් සියයට 50 කට වඩා ලංසු ප්‍රතික්ෂේප වී තිබුණි. එමගින් අරමුදල් බැදුම්කර වෙන්දේසියට ඉදිරිපත් කර ඉහළ ඵලදාවකට ආයෝජනය කිරීමට තිබූ අවස්ථා අහිමි කරගෙන තිබූ බව නිරීක්ෂණය විය. මෙහිදි මණ්ඩලයේ GS Committee මගින් ලංසු තීරණයේ දී වෙළඳපොල සාධක සලකා බලා තිබුණද, පවත්නා වෙළඳපොළ තත්ත්වයන් ඉක්මවා ඉහළ ඵලදා අනුපාතයකට යෑම නිසා මෙසේ ලංසු ප්‍රතිග්‍රහණය අවම වීමටද හේතුවී තිබූ බව නිරීක්ෂණය විය. | ආයෝජනවලදී ඵලදා අනුපාතය ඉහළ යන තත්ත්වයක් යටතේ ඉහළින් ලංසු ඉදිරිපත් කිරීමට උපක්‍රමශීලී වේ. මේ ආකාරයට අනිකුත් අවස්ථාවල කටයුතු කිරීමේ දී සාර්ථක ප්‍රතිඵල ඇතිකර ගෙන තිබේ. එසේම සමහර අවස්ථාවලදී මහ බැංකුව විසින් වෙන්දේසිය සඳහා ඉදිරිපත් කරන ලංසු වටිනාකමට වඩා අඩු අගයක් පිළිගන්නා අතර, එවැනි අවස්ථාවලදී ද මණ්ඩලය අපේක්ෂිත අනුපාත මත ඉදිරිපත් කරන ලද ලංසු ප්‍රතික්ෂේප වීමේ වැඩි සම්භාවිතාවක් පවතී. සමහර අවස්ථාවලදී විශාල ප්‍රමාණයේ තරගකාරී අයදුම්කරුවන්ගේ අනපේක්ෂිත හැසිරීම් මතද අප අපේක්ෂා කරන ප්‍රතිඵලයට බලපෑමක් ඇති කරනු ලැබේ. | සාමාජිකයන්ට ඉහළ ප්‍රතිලාභයක් ලබා දීමට හැකි පරිදි ආයෝජන කළඹ කළමණාකරණය කළ යුතුය. |
| (ඇ) | ප්‍රතිලාභ ගෙවීම දින 09 ක් තුල කිරීමට සැලසුම් කර ඒ පිළිබඳව සාමාජිකයින් හා සේවායෝජකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් 15 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද, එහි ප්‍රගතිය වැඩසටහන් 05 ක් වූ අතර, ප්‍රතිලාභ ගෙවීම විමධ්‍යගත කිරීමේ අදහසින් ශාඛා 05 ක් පිහිටුවීමට හා VIP කවුළු 01 ක් පිහිටුවීමට සැලසුම් කර තිබුණද එම කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි. | 2022 පැවති ඉන්ධන අර්බුදය හේතුවෙන් ප්‍රවාහන පහසුකම් සලසා ගැනීමට සේවායෝජකයින්ට හා අප ආයතනයට නොහැකි විය. ප්‍රතිලාභ ගෙවීම විමධ්‍යගත කිරීමේ අරමුණින් තවත් ප්‍රාදේශීය කාර්යාල 05 ක් ඒ සඳහා සහභාගි කර ගැනීමට සැලසුම් කර තිබුනද, කාර්ය මණ්ඩල සීමාවීම් සහ වෙනත් ප්‍රායෝගික ප්‍රශ්ණ මත ප්‍රතිලාභ ගෙවීම්, දැනට ප්‍රතිලාභ ගෙවීම් සිදුකරන ප්‍රාදේශීය කාර්යාල 07 මගින් පමණක් සිදුකල යුතු බවට අධ්‍යක්ෂක මණ්ඩලයට උපදෙස් ලබාදෙන ලදි. | සැලසුම් කල පරිදි අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | අරමුදලේ මූල්‍යමය ස්ථාවරත්වය අනුව සාමාජිකයින් සඳහා සුභසාධනමය | මණ්ඩලය මගින් ක්‍රියාත්මක සුභාසාධන ප්‍රතිලාභ, | සාමාජිකයන්ගේ දායක මුදල් වලින් සැදුම්ලත් |

| | | | |
|---|---|---|---|
| | යෝජනා ක්‍රම 10 ක් අරමුදලේ මිලියන 2.7 ක් වූ සක්‍රිය සාමාජිකයින් වෙනුවෙන් ක්‍රියාත්මක වේ. එම සුහසාධන සේවාවන් යටතේ සාමාජිකයෙකුට ලබාදෙන උපරිම මූල්‍යාධාර වටිනාකම් පසුගිය වසර 6 ත් 13 ත් අතර කාලයක සිට ඉහළ නැංවීමට මණ්ඩලය ක්‍රියාත්මක වී නොතිබුණි. | සාමාජිකයින්ගේ විශේෂ දායකත්වය ලබා නොගෙන සහ සාමාජික ශේෂයට හිලව් නොකරන ප්‍රතිලාභ විශේෂයකි. මෙම ප්‍රතිලාභ මණ්ඩලයේ ලාභ අලාභ ගිණුමේ වියදමක් වන බැවින්, නිසි ඇගයීමකින් හා පාලනයකින් තොරව සුහසාධන ප්‍රතිලාභ ලබාදීම සමස්ත සාමාජිකයින්ට වර්ෂ අවසානයේ ගෙවනු ලබන පොළිය හා ලාභාංශ ප්‍රතිශතය අඩුවීමට බලපානු ඇත. | අරමුදලක් වන බැවින් සාමාජිකයින්ට ඉහළ ප්‍රතිලාභයක් ලබාදීමට කටයුතු කල යුතුය. |
| (ඊ) | 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනතේ 18 (1) වගන්තිය හා 1988 අංක 47 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල (සංශෝධන) පනතේ 6 වන වගන්තිය මගින් කරන ලද සංශෝධන ප්‍රකාරව ස්වයං රැකියාවක නියුක්ත තැනැත්තෙකු හෝ සංක්‍රමණික කම්කරුවෙකු පනත යටතේ ලියාපදිංචි කර ගැනීමට ඉඩකඩ සලසා ඇත. Labour Force Survey – Annual Report – 2019 අනුව ශ්‍රී ලංකාවේ වාර්තාගත වී ඇති මුළු ස්වයංරැකියාලාභීන් සංඛ්‍යාව වූ 3,233,290 න් අරමුදලට ලියාපදිංචි වී ඇති මුළු ස්වයංරැකියාලාභීන් සංඛ්‍යාව 43,524 ක් හෙවත් සියයට 1.35 ක් විය. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| | (i) ලියාපදිංචි ස්වයං රැකියා ලාභීන්ගෙන් 33,120 ක ප්‍රමාණයක් අක්‍රිය වී ඇති අතර, ඒ අනුව ක්‍රියාකාරී සාමාජික සංඛ්‍යාව 10,404 ක් වැනි ඉතා පහල අගයක පැවතුණි. සාමාජිකත්වය අක්‍රිය වූ ස්වයං රැකියාලාභීන් 90 ක් ක්‍රියාකාරී බවට පත් කිරීමට සැලසුම් කර තිබුණද ක්‍රියාකාරී බවට පත් කර තිබුණේ රැකියාලාභීන් 32 ක් පමණි. | නිවැරදි දැනුවත් කිරීමේ ක්‍රමවේදයන් අනුගමනය නොකිරීම, සාමාජිකයන් විසින් ගෙවන ලද දායක මුදල් නිසි පරිදි සාමාජික ගිණුම් සඳහා යාවත්කාලීන නොවීම, 2015 වර්ෂයේ ප්‍රතිලාභ ගෙවීම් කොන්දේසි හා සාමාජික මාසික දායක මුදල් වැඩිකිරීම් පිළිබඳව සාමාජිකත්වය හා ස්වයං රැකියා නියුක්තිකයන් දැනුවත් නොවීම හා 2020-2022 කාලය තුල රට තුල පැවති කොවිඩ් වසංගත තත්ත්වය | ස්වයංරැකියාලාභීන් ලියාපදිංචි කිරිම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කල යුතුය. |

ආදී කරුණු මත අක්‍රීය සාමාජික සංඛ්‍යාව වැඩි අගයක් ගෙන ඇත.

(ii) පහත සදහන් පරිදි පසුගිය වර්ෂ 03 ක ප්‍රතිලාභ ලබාදී ඇති ස්වයංරැකියා ලාභීන්ගේ දත්ත අනුව අක්ෂි කාච සඳහා දායක විම, හදවත් සැත්කම් සහාය, ජීවිත රක්ෂණ සහ නිත්‍ය දුබලතා වන්දි ආදී ප්‍රතිලාභ ලබා ගත් සාමාජික සංඛ්‍යාව පහල අගයක පැවතුණි.

| ප්‍රතිලාභ වර්ගය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | 2020 | 2021 | 2022 |
| අක්ෂි කාච සඳහා දායක වීම් | 14 | 16 | 10 |
| හදවත් සැත්කම් සහාය | 05 | 11 | 01 |
| ජීවිත රක්ෂණය | 08 | 05 | 08 |
| නිත්‍ය දුබලතා වන්දි | 02 | 03 | 01 |
| එකතුව | 29 | 35 | 20 |

මෙයට ප්‍රධාන හේතුව වසර 03 ක මාසික දායක මුදල් නිසි පරිදි ගෙවා නොතිබීම හා සාමාජිකයින් විසින් ප්‍රතිලාභ ඉල්ලුම් කිරීමේ දී නිසි පරිදි නියමිත කාලය තුලදී ඉදිරිපත් නොකිරීම හා සාමාජිකයින්ගේ නොදැනුවත්භාවයයි.

ප්‍රතිලාභ ලබා දීම් හා කොන්දේසි පිළිබඳ සාමාජිකයින් දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය.

(iii) සංක්‍රමණික කම්කරුවන් ද අරමුදලට ලියාපදිංචි කර ගැනීමට 1988 අංක 47 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල (සංශෝධන) පනතින් නියම කර තිබුණද මණ්ඩලයේ සාමාජිකත්වය ලබා දිය ඇති මුළු සංක්‍රමණික සේවක සංඛ්‍යාව 2020, 2021 හා 2022 වර්ෂවලදී පිළිවෙලින් 04 ක්, 09 ක් හා 16 ක් විය.

සංක්‍රමණික කම්කරුවන් අප අංශයේ ලියාපදිංචි කිරීම සඳහා විදේශ සේවා නියුක්ති කාර්යංශය යටතේ වැඩසටහන් දියත් කලත් එම කාර්යංශය විසින්ද විදේශ සංක්‍රමණිකයින් සඳහා ප්‍රතිලාභ වැඩසටහන් හඳුන්වා දීම නිසා අප අංශයේ ලියාපදිංචි වීම අඩාල වී ඇත.

මණ්ඩලයේ සාමාජිකත්වය ලබා දීම් සම්බන්ධව දැනුවත් කිරීම වර්ධනය කළ යුතුය.

### 3.3 ප්‍රසම්පාදන කළමණාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු.මිලියන 41.57 ක් වූ ලැප්ටොප් පරිගණක 205 ක් මිලදී ගැනීම් ප්‍රසම්පාදනයේ දී එක් ප්‍රසම්පාදනයක් ලෙස සැලසුම් නොකර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 ප්‍රකාරව ජාතික තරඟකාරී මිල ක්‍රමය අනුගමනය කර වඩාත් තරඟකාරී මිල ගණන් ලබා ගත යුතු වුවද අවස්ථා 04 ක දී මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කර මිල දී ගැනීම සිදුකර තිබුණි. | රටෙහි පැවති කොරෝනා තත්ත්වය, අයහපත් ආර්ථික තත්ත්වය මත ඇණවුම් භාරගත් සමාගම් භාණ්ඩ සැපයීමට අපොහොසත් වීමත් අධික ඉල්ලුම හමුවේ, ලැප්ටොප් අත්පිට මුදලට ලබා දීමට සමාගම් වැඩි ප්‍රවණතාවයක් දැක්වීය. ඒ අනුව එක් අවස්ථාවකදී රු.මිලියන 10ට නොවැඩි වන සේ අදියර කිහිපයක් යටතේ ලැප්ටොප් පරිගණක කිහිපයක් මිලදී ගන්නා ලදී. මේ අනුව මාස 08 ක් වැනි කෙටි කාලයක් තුලදී ලැප්ටොප් 205ක් මිලදී ගැනීමට මණ්ඩලයට හැකි විය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 හා 3.4 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලයේ ආයෝජන කොට්ඨාශය ශක්තිමත් කර දැනට වඩා සුරක්ෂිතතාවයකින් හා ප්‍රශස්ථ ඉපැයීමක් පවත්වා ගැනීම සඳහා ප්‍රතිව්‍යුහගත කිරීමකට ලක් කරන ලෙස 2016 අගෝස්තු 26 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දී උපදෙස් ලබා දී තිබුණද ආයෝජන කොට්ඨාශයෙහි ආයෝජන කළඹ කළමනාකරණයට ඍජුව සම්බන්ධවන තනතුරු නාම 03ක පැවති පුරප්පාඩු 06 ක් 2022 දෙසැම්බර් 31 දින වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. | මෙම ක්ෂේත්‍රය තුල පෞද්ගලික අංශයේ ඉතා ඉහළ වැටුප් ගෙවීම් සිදු කරන බැවින් මණ්ඩලයට බඳවාගත් නිලධාරීන් කෙටි කාලයක් තුලදී ඉල්ලා අස්වීම මත අදාල පුරප්පාඩු නිරන්තරව ඇතිවේ. එසේම ඉල්ලුම්පත් කැඳවීමේදී ද තනතුර දැරීමට සුදුසුකම් සපුරන ලද හා ක්ෂේත්‍රයේ පළපුරුද්ද සහිත අයදුම්කරුවන් මෙම වැටුප් පරිමාණ යටතේ ඉල්ලුම් නොකරන බව නිරීක්ෂණය වේ. | වැටුප් පරිමාණ සංශෝධන සඳහා අනුමැතිය ලබා ගෙන පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |